# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/31 – 2021 අගෝස්තු 04 වැනි බදාදා – 2021.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළය සුළු කොට්ඨාසයේ, 575 - රතුකොහො ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පන්ගොල්ලාමඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක Maha/AKR/2017/629 හා 2018.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – හීපිටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0161**
උතුරට: අයි. එම්. යූසුෆ් හිමිකම් කියන හීපිටියවත්ත සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B සහ අයි. එම්. යූසුෆ් හිමිකම් කියන හීපිටියවත්ත.

02. **කැබලි අක්ෂර 'B' – හීපිටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.4007**
උතුරට: ඒ. එම්. ජී. අමරකෝන් හිමිකම් කියන හීපිටියවත්ත, මාර්ගය සහ අයි. එම්. යූසුෆ් හිමිකම් කියන හීපිටියවත්ත; නැගෙනහිරට: අයි. එම්. යූසුෆ් හිමිකම් කියන හීපිටියවත්ත, කැබලි අක්ෂර A, මාර්ගය (මා.සං.අ.) සහ මාර්ගය; දකුණට: මාර්ගය, එම්. එස්. එල්. ෆවුසියා උම්මා හිමිකම් කියන හීපිටියවත්ත සහ කපන ලද කාණුව; බටහිරට: අබ්දුල් කාදර් ලෙබ්බේ හිමිකම් කියන හීපිටියවත්ත, කැබලි අක්ෂර C සහ ඒ. එම්. ජී. අමරකෝන් හිමිකම් කියන හීපිටියවත්ත.

03. **කැබලි අක්ෂර 'C' – හීපිටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0261**
උතුරට: ඒ. එම්. ජී. අමරකෝන් හිමිකම් කියන හීපිටියවත්ත සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B, කපන ලද කාණුව සහ අබ්දුල් කාදර් ලෙබ්බේ හිමිකම් කියන හීපිටියවත්ත; බටහිරට: අබ්දුල් කාදර් ලෙබ්බේ හිමිකම් කියන හීපිටියවත්ත සහ ඒ. එම්. ජී. අමරකෝන් හිමිකම් කියන හීපිටියවත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2017/PC/263.
2021 අප්‍රේල් මස 22 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 226

1A – G 34773 – 25 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*